මගේ අංකය / எனது இல. / My No. PAL/G/SLSPC/01/2022/13 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 දෙසැම්බර් 30 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1958 අංක 04 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනතේ 14 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 8 හි 42 හා 43 ඡේද ප්‍රකාරව පෙර වර්ෂ වලදී සිදු වූ වැරදි අතීතානුයෝගිව ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත්කළ යුතු නමුත්, සංස්ථාව 2022 දෙසැම්බර් 31 දිනට හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි දක්වා තිබුණු රු. මිලියන 151.63ක් සහ 2021 වර්ෂයේ රු. මිලියන 170.45ක් වූ වැරදි නිවැරදි කිරීම්වලට අදාල සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 හි 27 ඡේදය අනුව මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයට ගිණුම්ගත කළ යුතු වේ. සංස්ථාව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද විස්තර අනුව සංස්ථාව සතු වතු 16න් හෙක්ටයාර් 71.38ක් වූ වලහන්දුව වතු යාය රු. මිලියන 620කට අගයකර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර තිබුණු අතර ප්‍රාදේශීය වතු සමාගම් 20කට අවුරුදු 53ක දිගුකාලීන බදු පදනමට පවරා දී තිබූ ඉඩම් 280ක ආයොජන දේපළ වටිනාකම රු. මිලියන 1,611.52ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද සංස්ථාව සතු වතු 15කට අයත් හෙක්ටයාර් 10,918ක් කිසිදු පදනමකට අගයකර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉඩම් සංවර්ධන අගය ලෙස රු. මිලියන 25.35ක් පමණක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

තවද කොළඹ 10 පිහිටි ප්‍රධාන කාර්යාල ඉඩම බැංකු තක්සේරුව අනුව රු. මිලියන 590ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 4.03ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව සංස්ථාව සතු ඉඩම් සාධාරණ අගයට ගිණුම්ගත කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත්, සංස්ථාව විසින් රු. මිලියන 643.92ක සේවක ප්‍රතිලාභ ගණනයේදී ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 හා 30 ඡේදයන්හි හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.2 අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනා ගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇතත් සංස්ථාවේ වතු 14 ක් පුරා විහිදුනු, දැව අස්වනු නෙළිය හැකි ගස් 99,502ක් ඇතුළුව ග්‍රාන්ඩිස්, ඇල්බීසියා, තේක්ක, යුකැලිප්ටස් යනාදී වනවගාවන් සමාලෝචිත වර්ෂය අවසානයටද නිසි තක්සේරුවකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. මිලියන 3,360.58 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 43 ඡේදය ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම, පරිනත හා පරිනත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව

ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබුණු රු. මිලියන 29.31ක පොල්, රබර්, ගම්මිරිස් යනාදී ජීව විද්‍යාත්මක වත්කම්වල අගය එසේ වර්ගීකරණයකර ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් රු. මිලියන 96.11ක ආදායමක් උපයා තිබුණද එම ගස්වල පිරිවැය වර්ෂයේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර නොතිබුණු බැවින් සංස්ථාවේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(ආ) වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. මිලියන 0.19ක් වර්ෂයේ පොළී ආදායම් ලෙස ගිණුම්ගත නොකර ස්ථාවර තැන්පතු ලෙස ගිණුම්ගත කිරීම නිසා 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබූ අතර ස්ථාවර තැන්පතු පොළී සමාන ප්‍රමාණයකින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අනුව ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලායෑම් තුළ ස්ථාවර තැන්පතුවල ආයෝජනය රු. මිලියන 0.36 ක් වුවද ස්ථාවර තැන්පතු උපලේඛනය අනුව එය රු. මිලියන 0.24 ක් වූ බැවින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායෑම් වටිනාකම රු. මිලියන 0.12 කින් අධිගණනය වී තිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලය සහ වතුයායන් අතර හා එකිනෙක වතුයායන් අතර සිදුවන ගනුදෙනු පිළිබඳ වාර්තා කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් වර්ෂය අවසානයේ දී තුලනය විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ රු.මිලියන 156.62ක හර ශේෂයක් පැවති අතර එය වෙනත් ණයගැතියෝ ලෙස ජංගම වත්කම්වල ඇතුළත් කර තිබුණි. මේ අනුව ජංගම ගිණුම් විධිමත්ව පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 1.2.3. නොසැසඳුණු පාලන ගිණුම්

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට වතුයායන්හි දේපළ පිරියත හා උපකරණ වර්ග 05ක පිරිවැය රු. මිලියන 442.44 ක් වූ අතර ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අනුව එහි පිරිවැය රු. මිලියන 329.92 ක් වූ බැවින් දේපළ පිරියත හා උපකරණවල මූල්‍ය ප්‍රකාශනවල සඳහන් හා උපලේඛනගත පිරිවැය අතර රු. මිලියන 112.53ක වෙනසක් නිරීක්ෂණය වී තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ පොත් අගය රු. මිලියන 421.33ක් වුවද ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යන උපලේඛනය අනුව එම අගය රු. මිලියන 421.24 ක් වූ බැවින් ධාරක ජීව විද්‍යාත්මක වත්කම් වල මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අගය හා උපලේඛනගත අගය අතර රු. මිලියන 0.09ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වතුයායන්හි බැංකු ශේෂය රු. මිලියන 4.33 ක් වුවද වතු ගිණුම් අනුව එය රු. මිලියන 4.27 ක් වූ බැවින් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම සංස්ථාවේ ගිණුම්වල සඳහන් අගය හා වතු ගිණුම්වල සඳහන් අගය අතර රු. මිලියන 0.06ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංස්ථාව විසින් මහජන බැංකුවෙන් රු. මිලියන 147.58ක අයිරාවක් ලබාගෙන තිබුණු අතර 2020 වර්ෂයේදී ලබාගත් රු. මිලියන 100ක ණය මුදලින් කොටසක් හෝ බැංකුව වෙත ගෙවීමට සමාලෝචිත වර්ෂයේදී පැවති අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් ගෙවීමට නොහැකිවී තිබුණි. එසේම 2022 වර්ෂය සඳහා බැංකු අයිරාවේ හා ණය මුදලේ පොළිය ලෙස රු. මිලියන 40.07ක් ගෙවිය යුතු වුවද ඉන් රු. මිලියන 6.54ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවීම්කර නොතිබුණි. තවද මෙම බැංකු ණය හා අයිරා ශේෂය වර්ෂ 5 ක දිගුකාලීන ණය මුදලක් ලෙස ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා පවත්වන බව කළමනාකරණය විසින් කෙටුම්පත් විගණන වාර්තාව සඳහා ලබාදෙන ලද පිළිතුර මගින් දන්වා ඇත.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු. මිලියන 301.44 ක වෙළඳ හා අනිකුත් ලැබිය යුතු ශේෂය තුළ වර්ෂ 05 ඉක්මවූ ශේෂය රු. මිලියන 52.88 ක් වූ අතර වර්ෂ 1ට වැඩි ශේෂය රු. මිලියන 10.58ක් වුවද එම මුදල් නිරවුල් කරගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රතිපාදනයන්ද සිදුකර නොතිබුණි.

### 1.2.5. විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. මිලියන 133.03ක ශේෂයන් සඳහා ශේෂ සනාථයන් හා වතු අංශයේ වෙනත් ගෙවිය යුතු ශේෂ රු. මිලියන 43.68ක් හඳුනාගැනීමට අවශ්‍ය උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. මිලියන 144.83ක් සඳහා ශේෂ සනාථනයන් සහ පසුකාලීන නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය

ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තා**

**2.1.** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.1 (අ) (ආ) (ඇ) (ඈ) (ඉ), 1.2.3 (අ) (ආ) 1.2.4 (අ) (ආ) 1.2.5 (අ) (ආ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2.** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අනාෳකාරයකින් සාමානාෳ ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 සහ 16 වන වගන්ති හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II කොටසේ 16(i) සහ 27 වගන්ති | සංස්ථාවේ රු. මිලියන 637.48ක සේවක අර්ථසාධක අරමුදල් දායකය, රු. මිලියන 46.01ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකය, රු. මිලියන 53.06ක වතු කාර්යමණ්ඩල අර්ථසාධක සංගමයේ දායකය සහ රු. මිලියන 14.48ක ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයේ දායකය සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ගෙවිය යුතු අධිභාර වටිනාකම පනත ප්‍රකාරව සකස්කර නොතිබුණු අතර නඩු කටයුතු වලින් තීරණය වූ පිළිවෙලින් රු. මිලියන 77.73ක් හා රු. මිලියන 6.43 ක් පමණක් අධිභාර ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 02 වන කොටසේ 5(1) වගන්තිය | සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ අනුව නියමිත දිනට පාරිතෝෂික නොගෙවීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම රු. මිලියන 552.31ක් විය. 2022 වර්ෂය අවසාන වන විට පාරිතෝෂික සඳහා ගෙවිය යුතු අධිභාර වටිනාකම පනත ප්‍රකාරව සකස්කර නොතිබුණු අතර නඩු කටයුතු වලින් තීරණය වූ රු. මිලියන 20.62ක අධිභාර ප්‍රමාණයක් ගිණුම්ගත කර තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2017 අංක 24 දරන දේශිය ආදායම් බදු (සංශෝධිත ) පනතේ 90 හා 93 වගන්ති | ව්‍යාපාරයකින් ලබන ආදායම මත ස්වයං තක්සේරු පදනම මත කාර්තුවක් අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිළිවෙලින් අගෝස්තු 15, නොවැම්බර් 15, පෙබරවාරි 15 හා ඊළඟ වර්ෂයේ මැයි 15 යන දින හෝ ඊට පෙර ආදායම් බදු ගෙවිය යුතුය. ඉතිරි බදු මුදලක් වෙතොත් ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ගෙවිය යුතු නමුත් සංස්ථාව විසින් එබදු බදු වාර්තා පසුගිය වර්ෂ 15කට වැඩි කාලයක සිට ඉදිරිපත්කර නොතිබුණි. 2022 වර්ෂය සඳහා ගිණුම්කරණ ලාභය රු. මිලියන 19.67ක් පැවතියද ස්වයං තක්සේරු පදනම මත අදාළ ආදායම් බදු වාර්තා 2023 අගෝස්තු 31 දින වන විටත් යවා නොතිබුණි. පසුගිය වර්ෂ 27 කාලය තුළ (1995-2021) වර්ෂ 4 කදී පමණක් ලාභ ලබා තිබූ බැවින් බදු ගෙවීමේ අවශ්‍යතාවයක් ඇති නොවන බව ද මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර තිබුණි. |
| (ඈ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන පරීක්ෂාවක් කලයුතු වුවද සංස්ථාවේ වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඉ) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ වර්තමානය වන විට භාවිතයට ගත නොහැකි අපහරණය කලයුතු මට්ටමේ පවතින ලොරි රථ 15 ක්, ට්‍රැක්ටර් හා ටේලර් 09 ක්, කාර් රථ 06 ක්, ජීප් රථ 05 ක්, ගිලන් රථ 01 ක්, මෝටර් සයිකල් 30 ක් සහ වතුර බව්සරයක් වශයෙන් සමස්ත වාහන 67ක් විගණිත දිනය වන විටත් අපහරණය කිරීමට කටයුතු කර |

| | | |
|---|---|---|
| | | නොතිබුණි. |
| (ඊ) | 2021 නොවැම්බර් 18 දිනැති අංක 2021/01 දරන පොදු ව්‍යාපාර සඳහා යහපාලන මාර්ගෝපදේශ ඡේද අංක 3.2 | කිසියම් තනතුරකට බඳවා ගැනීම සඳහා තිබිය යුතු අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් ඇතුළත් කර සකස් කරන ලද බඳවාගැනීම් හා උසස්කිරීමේ පරිපාටිය මේ දක්වා අනුමත කර නොතිබුණි. |
| (උ) | 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව හා අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති පරිපාලන සහකාර, වැඩ සුපරීක්ෂක, සහකාර ගණකාධිකාරි හා කාර්යාල කාර්ය සේවක තනතුරු 04 සඳහා පත්වීම් ලබාදී එම නිලධාරින් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 2.66 ක වියදමක් දරා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඹ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ඡේදය අනුව අවම වශයෙන් වසර 03 ක කාලයකට අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවද සංස්ථාව 2022 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 (අ) අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගී වන සියලුම ලංසුකරුවන් වෙතින් ලංසු සුරක්ෂණ ලබාගත යුතු වුවද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන් 11ක් සඳහා තේ පැළ 1,159,600ක් මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී ලංසු සුරක්ෂණ ලබාගෙන නොතිබීම නිසා ලංසුකරුවන් විසින් ලංසු ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් තේ පැළ 30,000ක් පමණක් මෙම ලංසු කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණි.

(ඇ) වලහන්දූව රාජ්‍ය වතුයායේ තේ පැල සිටුවීමට අදාල ප්‍රසම්පාදනයේ පුවත්පත් දැන්වීම අනුව අක්කර 20 ක භූමි ප්‍රමාණයක එම කාර්ය සිදුකිරීමට සැලසුම්කර තිබුණද ටෙන්ඩරය පිරිනමන අවස්ථාවේදී අක්කර 15 ක භූමි ප්‍රමාණයක්ද ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු අක්කර 08 ක භූමි ප්‍රමාණයක්ද තේ වගාවට සුදුසු බව නිර්දේශකර කිරීම තුළින් ප්‍රසම්පාදනයේ මූලික අදියරේදී අවශ්‍ය භූමි ප්‍රමාණය නිසි පරිදි හඳුනාගෙන ප්‍රසම්පාදනයට පෙර සූදානමක් නොතිබුණ බැවින්

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම් පැහැර හැර තිබූ බව නිරීක්ෂණය විය. එසේම ලංසුකරු තෝරාගැනීමේදී අඩුම මිලගණන් ඉදිරිපත්කර තිබුණු ලංසුකරු තෝරාගෙන තිබුණු නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 ප්‍රකාරව පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණු බැවින් 2022 නොවැම්බර් 19 සිට මාස දෙකකින් අක්කර 08ක පැළ සිටුවා අවසානකළ යුතු නමුත් 2023 ඔක්තෝබර් අවසන් වන විට අක්කර 06ක පමණක් තේ පැළ සිටුවා අවසන් කර තිබූ අතර ඉතිරි අක්කර 02හි භූමි සැකසීම පමණක් ආරම්භ කර තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 හා 5.4.8 ට අනුකූල නොවන පරිදි රාජ්‍ය වැවිලි සංස්ථාවේ කැලෑබොක්ක තේ කර්මාන්ත ශාලාවේ Furnace යන්ත්‍රය අලුත්වැඩියා කිරීමට අදාල රු. මිලියන 1.435ක ප්‍රසම්පාදනයේදී ලංසු සුරක්ෂණයක් හා කාර්යසාධන සුරක්ෂණයකින් තොරව ගිවිසුම්ගතවී තිබුණි.

(ඉ) 2022 ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 වර්ෂයේදී අතිරේක හා සුළු බෝග හෙක්ටයාර් 34.50 ක් වගා කිරීමට සැලසුම් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාකාරකමක් වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

(ඊ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2022 දී හෙක්ටයාර් 18ක දැව වගා කිරීමේ ඉලක්කයක් සංස්ථාව සතුව පැවතියද වර්ෂය අවසන්වන විට හෙක්ටයාර් 5ක පමණක් දැව වගාකර තිබුණු බැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය සියයට 28ක් පමණක් වී තිබුණි.

(උ) සංස්ථාව විසින් වර්ෂය තුළ රු. මිලියන 89.66 ක් වැයකර කර්මාන්තශාලා 03 ක යන්ත්‍රෝපකරණ නවීකරණ කටයුතු හා අනෙකුත් නඩත්තු කටයුතු සිදු කිරීමට සැලසුම් කළද රු. මිලියන 17.33 ක් වැයකර කර්මාන්තශාලා 02 ක කටයුතු පමණක් සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කර තිබුණි. එය මුළු ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 19 ක් පමණි.

(ඌ) 2022 වර්ෂයේ රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ අස්වැන්න කිලෝග්‍රෑම් 6,659,726 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ප්‍රමාණය වූ කිලෝ ග්‍රෑම් 10,338,657 හා සැසඳීමේදී සියයට 36ක අඩුවීමක් වූ අතර 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 21කින් පසුබෑමක් බව නිරීක්ෂණය විය. 2022 වර්ෂයේදී සංස්ථාවට අයත් සියලුම වතුයායන්වල තේ අස්වැන්න සියයට 10 සිට සියයට 35 දක්වා පරාසයක අඩුවීමක් නිරීක්ෂණය විය.

(එ) 2022 වර්ෂයේදී බාහිර වැවිලිකරුවන් වෙත ලබාදී තිබූ භූමි ප්‍රමාණයෙන් තේ කිලෝග්‍රෑම් 1,006,605ක අස්වැන්නක් අපේක්ෂා කර තිබුණද සත්‍ය වශයෙන් ලබාගෙන තිබුණේ තේ

කිලෝග්‍රෑම් 601,960 ක් පමණි. එය අපේක්ෂිත තේ අස්වැන්න හා සැසඳීමේදී සියයට 40ක අඩුවීමකි.

(ඒ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 200ක අමාත්‍යාංශ ප්‍රදාන මගින් ඌන උපයෝජිත ඉඩම් හෙක්ටයාර් 180 ක තේ පැළ 2,250,000 ක් සැකසීම හා සිටුවීම සඳහා සැලසුම්කර තිබුණද වර්ෂය අවසාන වන විට පැළ සිටුවීම සිදුකර තිබුණේ හෙක්ටයාර් 96.91 ක පමණි. ව්‍යාපෘතියේ මූලික සැලැස්ම අනුව සංස්ථාව විසින් තේ පැළ සකසා වගා කිරීමට සැලසුම් කළද තේ පැළ 1,079,172ක් බාහිර පාර්ශවයන්ගෙන් රු. මිලියන 28.18ක් වැයකර මිලදී ගෙන තිබුණු අතර 2023 සැප්තැම්බර් 30 වන විට හෙක්ටයාර් 146 ක පැළ සිටුවා අවසන් කර තිබෙන බව සංස්ථාවේ සභාපති විසින් විගණනයට වාර්තා කර තිබුණි.

## 2.3. වෙනත් කරුණු

2022 දෙසැම්බර් 31 දිනට වසර 05 ඉක්මවූ රු. මිලියන 228.81ක ණයහිමි ශේෂ 8ක් පැවති අතර ඒ තුළ හලාවත වැවිලි සමාගම වෙත රු.මිලියන 33 ක් ද ලංකා මිනරල් සෑන්ඩ් සමාගමට රු. මිලියන 25ක් ද පොහොර සංස්ථාවට රු. මිලියන 35ක් ද රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට රු. මිලියන 28ක් හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත රු. මිලියන 97 ක්ද ඇතුළත් වී තිබුණු නමුත් එම මුදල් පියවීමට සංස්ථාව විසින් කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# SRI LANKA STATE PLANTATIONS CORPORATION



# ANNUAL ACCOUNTS 2022

*No. 257, Siri Dhamma Mawatha, Colombo 10,*
*Tel. : 011-4194877, Fax : 011 2438635, e-mail : slspc@sltnet.lk*

*Date :29th May 2023*

# *Sri Lanka State Plantations Corporation*

## *Annual Accounts 2022*

## Contents

*Statement of financial position………………………2*

*Statement of Income………………………3*

*Statement of Changes in Equity………………………4*

*Statement of Cash flows………………………5*

*Notes to the financial Statements (Accounting Policies)…………………6-12*

*Notes to the financial Statements……………13-21*

## *Our Vision*

*To be the Government Owned Strongest Commercial Enterprise in the Plantation Sector*

## *Our Mission*

*To contribute a maximum to the Gross Domestic Product of the Country as well as to the well-being of the Plantation Worker families and neighboring villages by the proper management of the assets of Sri Lanka State Plantations Corporation through worker participation*

## Sri Lanka State Plantations Corporation

**STATEMENT OF FINANCIAL POSITION**

| In LKR.<br>As at 31st December | Note | Page No. | 2022 | 2021 |
|---|---|---|---|---|
| **ASSETS** | | | | |
| **Non-Current Assets** | | | | |
| Property, Plant and Equipment | 8 | 13 | 1,194,116,372 | 957,032,724 |
| Biological Assets - Consumable | 9 | 15 | 3,360,565,296 | 3,356,355,765 |
| Investment Property | 10 | 16 | 1,611,520,641 | 1,611,520,641 |
| Fixed Deposits | | | 9,785,400 | 9,425,987 |
| Deferred Assets | 26 | 21 | 394,857 | 438,730 |
| **Total Non-current Assets** | | | **6,176,382,566** | **5,934,773,847** |
| **Current Assets** | | | | |
| Inventories | 11 | 17 | 67,399,258 | 63,861,196 |
| Trade and Other Receivables | 12 | 17 | 301,442,535 | 248,384,533 |
| Cash and Cash Equivalents | 13 | 18 | 109,537,932 | 41,794,882 |
| **Total Current Assets** | | | **478,379,725** | **354,040,611** |
| **Total Assets** | | | **6,654,762,290** | **6,288,814,458** |
| **EQUITY AND LIABILITIES** | | | | |
| **Capital and Reserves** | | | | |
| Contributed Capital | 14 | 18 | 6,072,492,850 | 5,893,852,850 |
| Retained Earnings | | | (2,258,965,172) | (2,127,008,077) |
| **Total equity** | | | **3,813,527,678** | **3,766,844,772** |
| **Non-current liabilities** | | | | |
| Employee Benefit Obligations | 15 | 18 | 643,923,619 | 610,141,017 |
| **Total Non-current liabilities** | | | **643,923,619** | **610,141,017** |
| **Current liabilities** | | | | |
| Trade and Other Payables | 16 | 19 | 1,949,734,849 | 1,640,065,683 |
| Bank Loan | 16.1 | 19 | 100,000,000 | 100,000,000 |
| Bank Overdraft | 13 | 18 | 147,576,144 | 171,762,986 |
| **Total Current liabilities** | | | **2,197,310,994** | **1,911,828,669** |
| **Total liabilities** | | | **2,841,234,612** | **2,521,969,686** |
| **Total equity and liabilities** | | | **6,654,762,290** | **6,288,814,458** |

The accounting policies and notes on pages 5 through 21 form an integral part of the financial statements.

The undersigned certify that these financial statements are prepared in accordance with Sri Lanka Accounting Standards.

**Mr. S.I.M.Hassan**
*Deputy General Manager - Finance*

The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. Approved and signed for and on behalf of the Board of Directors of Sri Lanka State Plantations Corporation by,

| | | |
|---|---|---|
| **Mr. Srimal Wijesekara**<br>Chairman/CEO | **Mr. Y.K.Wagodapola**<br>Board Member | **Mr. W.W.M.B.P.Kamburadeniya**<br>Board Member |

***May 29, 2023 Colombo.***

**STATEMENT OF INCOME**

| In LKR.<br>Year ended 31st December | Notes | Page No. | 2022 | 2021 |
|---|---|---|---|---|
| **Revenue** | 17 | 20 | **1,070,663,514** | **845,341,718** |
| Cost of Sales | | | (934,986,055) | (1,027,539,188) |
| **Gross Profit / (Loss)** | | | **135,677,459** | **(182,197,471)** |
| Other Income | 18 | 20 | 157,979,459 | 194,790,022 |
| Administrative Expenses | 19 | 20 | (224,870,036) | (204,870,371) |
| **Operating Profit / (Loss)** | | | **68,786,883** | **(192,277,820)** |
| Finance Income | 18 | 20 | **1,974,535** | 1,787,646 |
| Finance Expenses | 20 | 20 | (51,089,659) | (40,707,422) |
| **Profit/ (Loss) for the Period** | | | **19,671,760** | **(231,197,596)** |

The accounting policies and notes on pages 5 through 21 form an integral part of the financial statements.

# Sri Lanka State Plantations Corporation

**STATEMENT OF CHANGES IN EQUITY** **In LKR.**

**Year ended 31 December 2022**

| | Capital<br>Rs. | Land Contribution<br>Rs. | Accumulated Profit/(Loss)<br>Rs. | Total<br>Rs. |
|---|---|---|---|---|
| **Balance as at 01 January 2021** | 3,659,250,925 | 2,220,601,926 | (1,725,362,785) | 4,154,490,066 |
| Grants Received from Treasury | 14,000,000 | - | - | 14,000,000 |
| Loss for the year | - | - | (231,197,596) | (231,197,596) |
| Prior year adjustments (Note 25) | - | - | (170,447,696) | (170,447,696) |
| **Balance as at 31 December 2021** | **3,673,250,925** | **2,220,601,926** | **(2,127,008,077)** | **3,766,844,772** |
| **Balance as at 01 January 2022** | 3,673,250,925 | 2,220,601,926 | (2,127,008,077) | 3,766,844,774 |
| Grants Received from Treasury | 178,640,000 | - | - | 178,640,000 |
| Profit for the year | - | - | 19,671,760 | 19,671,760 |
| Prior year adjustments (Note 25) | - | - | (151,628,855) | (151,628,855) |
| **Balance as at 31 December 2022** | **3,851,890,925** | **2,220,601,926** | **(2,258,965,172)** | **3,813,527,679** |

The accounting policies and notes on pages 5 through 21 form an integral part of the financial statements.

## Sri Lanka State Plantations Corporation

**STATEMENT OF CASH FLOWS**

**In LKR.**

| **Year ended 31st December** | **Notes** | **2022** | **2021** |
|---|---|---|---|
| **Cash Flows from Operating Activities** | | | |
| Net Profit /(Loss) Before Taxation | | **19,671,760** | **(231,197,596)** |
| **Adjustments for :** | | | |
| Depreciation of Biological Assets | 8.1 | 3,426,102 | 3,035,076 |
| Depreciation of Assets | 8 | 11,105,732 | 9,428,089 |
| Amortization of deferred Assets | | 43,874 | 39,128 |
| Finance Expenses | 20 | 51,089,659 | 40,707,422 |
| Finance Income | 18 | (1,974,535) | (1,787,646) |
| Gratuity Provision | 15 | 35,498,178 | 37,508,004 |
| Audit fee Provisions | | 692,504 | 547,019 |
| Insurance Provisions | | 1,035,757 | 954,089 |
| Government Grants & Subsidy | 18 | (592,667) | (1,575,000) |
| Prior year adjustments | 25 | (151,628,855) | (175,084,833) |
| **Profit before Working Capital Changes** | | **(31,632,493)** | **(317,426,248)** |
| **Changes in Working Capital** | | | |
| (Increase) / Decrease in Inventories | | (3,538,062) | 10,734,339 |
| (Increase) / Decrease in Trade and Other Receivables | | (53,058,002) | (64,358,989) |
| Increase / (Decrease) in Current Liabilities | | 325,198,986 | 392,131,886 |
| **Cash generated from operations** | | **268,602,921** | **338,507,236** |
| Gratuity Paid | | (25,682,747) | (15,461,867) |
| Finance Cost Paid | 20 | (42,952,373) | (39,107,422) |
| **Net cash generated from operating Activities** | | **168,335,308** | **(33,488,302)** |
| **Cash flows from investing activities** | | | |
| Finance Income | 18 | 1,632,892 | 1,787,646 |
| Government Grants & Subsidy | 18 | 592,667 | 1,575,000 |
| Treasury Grants Received | 14 | 178,640,000 | 14,000,000 |
| Additions to Property, Plant and Equipment | 8 | (252,702,032) | (51,141,051) |
| Additions to Biological Assets | 9 | (4,209,531) | (6,132,431) |
| Investment in FDs | | (359,413) | (250,181) |
| **Net cash flow from in Investing Activities** | | **(76,405,417)** | **(40,161,017)** |
| **Net Increase / (Decrease) in Cash and Cash Equivalents** | | **91,929,891** | **(73,649,318)** |
| **Movement in cash and cash equivalents** | | | |
| At the beginning of the period | 13 | (129,968,104) | (56,318,786) |
| Increase/(Decrease) for the year | | 91,929,891 | (73,649,318) |
| **Cash & Cash Equivalents at end of the year** | 13 | **(38,038,213)** | **(129,968,104)** |
| **Cash & Cash Equivalents at end of the year (Note 13)** | | | |
| Cash in hand and at bank | | | |
| - Head Office | | 105,048,534 | 40,829,610 |
| - Estates | | 4,489,398 | 965,273 |
| Bank Overdraft | | (147,576,144) | (171,762,986) |
| | | **(38,038,213)** | **(129,968,104)** |

## Notes to the Financial Statements
## Accounting Policies
## Year ended 31 December 2022

### 1. CORPORATE INFORMATION

**General**

Sri Lanka State Plantations Corporation (Corporation) is a Government Corporation incorporated in 1958 under the Act No. 4 of 1958 and domiciled in Sri Lanka. It is a Government Corporation located at No 257, Siri Dhamma Mawatha, Colombo 10.

The Corporation prepares financial statements for the twelve month's period ended 31st December and these financial statements are authorized/Approved by the board of directors.

**Principal Activities**

Manufacture and marketing of made tea through tea auction, selling latex and minor or export crops (Cloves, Pepper, Cardamom, Cinnamon etc.) and planting and selling commercial timber of the Corporation.

### 2. BASIS OF PREPARATION

The Financial Statements have been prepared in accordance with Sri Lanka Accounting Standards comprising SLFRS and LKAS as issued by the Institute of Chartered Accountants of Sri Lanka.

The financial statements have been prepared on a historical cost basis other than the biological assets which are at fair value.

The financial statements are presented in Sri Lankan Rupees.

### 3. SUMMARY OF SIGNIFICANT ACCOUNTING POLICIES

**3.1.1 Significant Accounting Policies**

The following are the significant accounting policies used by the Corporation in preparing these financial statements.

**3.1.2 Property Plant and Equipment**

Property, Plant and Equipment is stated at cost net of accumulated depreciation and accumulated impairment losses, if any. Such cost includes the cost of replacing component parts of the property, plant and equipment and borrowing costs for long-term construction projects if the recognition criteria are met. When significant parts of property, plant and equipment are required to be replaced at intervals, the Corporation derecognizes the replaced part, and recognizes the new part with its own associated useful life and depreciation. Likewise, when a major inspection is performed, its cost is recognized in the carrying amount of the plant and equipment as a replacement if the recognition criteria are satisfied. All other repair and maintenance costs are recognized in the income statement as incurred.

**3.1.3 Depreciation**

Depreciation is provided on the Property, Plant and Equipment acquired and disposed during the year from date of purchase to the date of disposal.

The estimated useful lives and rates of depreciation of Property, Plant and Equipment are as follows.

| Item | Useful Life | Rate |
|---|---|---|
| Buildings | 20 years | 5% |
| Motor Vehicles | 4 years | 25% |
| Furniture and Fittings | 8 years | 12.5% |
| Office Equipment | 8 years | 12.5% |
| Machinery | 8 years | 12.5% |
| Computer and Printers | 3 years | 33.33% |

**3.1.4 Biological Assets**

Biological assets relate to a living animal or a plant. According to LKAS 41, certain common features exist for biological assets, i.e. (a) Capability to change (capability for biological transformation) (b) Management of change (Management facilitates biological transformation by enhancing the conditions necessary for the process to take place. Such management distinguishes agricultural activity from other activities. For example, harvesting from unmanaged sources) and (c) Measurement of change (The change in or brought about by biological transformation or harvest is measured and monitored as a routine management function.)

Biological assets are two types namely, bearer biological assets and consumable biological assets.

**3.1.4.1 Bearer Biological Assets**

Bearer Biological Assets are the assets other than consumable biological assets and would include the major plantations such as Tea bushes, Rubber Trees and any field crops for the corporation. These would be carried at Cost less any accumulated depreciation and any accumulated impairment losses as per the option given by CA Sri Lanka and shown with Property, Plant and Equipment from the year 2022.

The estimated useful lives of the bearer biological assets are as follows.

| | | | |
|---|---|---|---|
| Coconut | 25 years | Cocoa | 20 years |
| Pepper | 15 years | Cinnamon | 25 years |
| Rubber | 35 years | Nutmeg | 30 years |
| Cloves | 50 years | Ginger | 01 year |
| Coffee | 25 years | Tea | 100 years |
| Arecanut | 40 years | | |
| Cardamom | 20 years | | |

**3.1.4.2 Consumable Biological Assets**

Consumable biological assets are those that are to be harvested as agricultural produce or sold as biological assets and comprises of timber. Agricultural produce is valued as fair value less estimated point of sale costs and costs necessary to get them to the market. A gain or loss on valuation is recognised under the Statement of Comprehensive Income.

**3.1.4.3 Deferred Assets**

Deferred Assets are amortized at 10 % per annum.

**3.1.5 Investment property**

Investment property includes properties held for capital appreciation and / or to earn rental income. They are initially measured at cost, including related transaction costs and costs incurred subsequently to add to, replace part of, or service a property. Subsequent measurement is also at cost less accumulated depreciation.

**3.1.6 Capital work in progress**

Capital expenses incurred during the year, which are not capitalized as at the balance sheet date are shown as Capital work in progress, whilst the capital assets which have been capitalized during the year and put to use have been transferred to Property Plant & Equipment.

**3.1.7 Leases**

The determination of whether an arrangement is a lease, or it contains a lease, is based on the substance of the arrangement, and requires an assessment of whether the fulfilment of the arrangement is dependent on the use of a specific asset or assets and the arrangement conveys a right to use the asset.

**Finance leases**
Agreements which transfer to counterparties substantially all the risks and rewards incidental to the ownership of assets, but not necessarily legal title, are classified as finance leases.
When the Corporation is a lessee under finance leases, the leased assets are capitalised and included in 'Property, plant and equipment' and the corresponding liability to the lessor is included in lease creditors. A finance lease and its corresponding liability are recognised initially at the fair value of the asset or, if lower, the present value of the minimum lease payments. Finance charges payable are recognised in 'Net interest income' over the period of the lease based on the interest rate implicit in the lease so as to give a constant rate of interest on the remaining balance of the liability.

**Operating leases**
All other leases are classified as operating leases. When the Corporation is the lessee, leased assets are not recognised on the balance sheet. Rentals payable and receivable under operating leases are accounted for on a straight-line basis over the periods of the leases and are included in 'Administrative expenses' and 'Other operating income', respectively.

**3.2.1 Inventories**

Inventories are recognized at cost and net realizable value, whichever is lower after making due allowance for obsolete and slow moving items which are valued at 'First in first out' basis.

**Measurement of inventories**

**3.2.2 Cost of Inventories**

**Raw Materials**
Cost of purchases together with any incidental expenses.

**Work in progress**
Raw material cost and variable manufacturing expenses in full.

**Finished Goods**
Raw material cost and variable manufacturing expenses in full.

**3.2.3 Cash and Cash Equivalents**

Cash and cash equivalents comprise cash in hand and bank, fixed deposit investments, other short-term highly liquid investments with original maturities of six months or less. Bank overdrafts are shown within borrowings in current liabilities on the balance sheet.

**3.2.4 Research costs**

Expenditure on research activities, undertaken with the prospect of gaining new scientific or technical knowledge and understanding, is recognized in profit or loss when incurred.

**4. LIABILITIES AND PROVISIONS**

**4.1 Retirement Benefit Obligations**

**4.1.1 Defined benefit plan – Retirement Gratuity**

The Corporation is liable to pay Gratuity in terms of the Payment of Gratuity Act No.12 of 1983.The liability for gratuity to an employee arises only on completion of five years of continued service with the Corporation. In order to meet this liability, a provision is carried forward in the Balance Sheet. The resulting difference between the brought forward provision at the beginning of a year and the carried forward provision at the end of the year is recognised in the Income Statement.

The liability is not externally funded. The item is grouped under Non-Current Liabilities in the Balance Sheet.

**4.1.2 Defined Contribution Plans- Employee Provident Fund & Employee Trust Fund**

The Corporation contributes to Employees' Provident Fund and Employees' Trust Fund. These contributions are covered by relevant contribution funds in line with respective regulation. Obligations for contributions to the plans covering the employees are recognized as an expense in the income statement.

**Employees' Provident Fund**
